# සාම්ප්‍රදායික සහ නූතන ආහාර අතර තරඟය : සහල්වලට එදිරිව තිරිඟුපිටි පිළිබඳව සංසන්ධනාත්මක අධ්‍යයනයක්

**පී.එල්.සී.ජේ. ගමගේ සහ එම්.බී. රණතිලක**

*ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙනිය විශ්වවිද්‍යාලය*

***මූල පද:*** *දේශීය ආහාර, විදේශීය ආහාර, තිරිඟු පිටි පරිභෝජනය*

## හැඳින්වීම

වර්තමානයේ ආහාර පරිභෝජන රටාව, ආහාර ඉල්ලුම හා එහි ප්‍රවණතාවයන් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ඒ හා සම්බන්ධ ඓතිහාසික තත්ත්වයන්ද වැදගත් වේ. වර්ෂ 1505 සිට සිදු වූ විදේශීය ආක්‍රමණයන්ගෙන් පසු කෘෂිකර්මාන්තය කෙරෙහි පැවති රාජ්‍ය අවධානය අවම වූ අතර ආහාර නිෂ්පාදනය පහත වැටීම නිසා සහල් ප්‍රමුඛ ආනයන ද්‍රව්‍යයක් බවට පත් විය (සෝමරත්න, 1991). නමුත් ක්‍රමක්‍රමයෙන් සහල් ආනයනය පහළ ගොස් වර්තමානය වන විට තිරිඟු ආනයනය ඉහළ අගයක්ව පවතින බව ආහාර ශේෂ පත්‍ර පිරික්සීමෙන් පැහැදිළි වේ. 1961 දී සහල් ආනයනය තිරිඟු ආනයනය අභිබවා පැවති අතර එහි පරතරය මෙට්‍රික් ටොන් 816,990 කි. 2013 වන විට සහල් මෙට්‍රික් ටොන් 22,930ක් හා තිරිඟු මෙට්‍රික් ටොන් 494,400ක් ලෙස මෙට්‍රික් ටොන් 471,470ක විශාල පරතරයක් සහිතව තිරිඟු ආනයනිත ප්‍රමාණය ඉහළ ගොස් ඇත (ආහාර ශේෂ පත්‍රය 1961, 2013). එය ශ්‍රී ලංකාවේ වර්තමාන පරිභෝජන රටාව පිළිබිඹු කරන කැඩපතකි.

වර්තමානය වන විට  තිරිඟු පිටි, සහල් පරිභෝජනය සඳහා බලපෑම් කිරිමට තරම් සමත් වීම කාගේත් අවධානයට පාත්‍ර වූ කරුණකි. මේ ආකාරයට තිරිඟු පිටි ධාන්‍යමය ආහාර ද්‍රව්‍ය අතරින් ඉතා වැදගත් හා ජනප්‍රිය ද්‍රව්‍යක් බවට පත්වෙමින් පවතී. සහල් සමඟ සංසන්දනාත්මකව දක්වන විට තිරිඟු ආශ්‍රිත ආහාර පිළියෙල කර ගැනීමේ පහසුව මෙම ජනප්‍රියත්වයට හේතු වී ඇති අතර තිරිඟු පිටි මිලෙන් අඩු ද්‍රව්‍යක් වීමද එහි පරිභෝජනය වැඩි වීමට හේතු වේ (ආරියවර්ධන, 2003). නාගරීකරණය හේතුවෙන් ආසියාතික රටවල සහල් මත සෘණ බලපෑමකුත් තිරිඟු පරිභෝජනය මත ධන බලපෑමකුත් සිදු කරන බව ආසියාතික රටවල් ආශ්‍රයෙන් සිදු කර ඇති අධ්‍යයන මඟින් තහවුරු කර ඇත. එසේම කාන්තා සේවා නියුක්තිය නිසා ගෘහණියට ආහාර පිසීම සඳහා විවේකයක් නොමැති වීම, ආදායම් මට්ටම් ඉහළ යාම, නාගරීකරණය යන සාධක හේතුවෙන් ක්ෂණික හා විදේශීය ආහාර සපයන අවන්හල් වෙතින් තම පරිභෝජන අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට යොමු වේ.

මෙම සන්දර්භය තුළ වර්තමානයේ විදේශීය පිසූ ආහාර අවන්හල් ද ව්‍යාප්ත වෙමින් පවතියි. එම ආයතන අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයන මඟින් සපයා ගන්නා

අතර එහිදී තිරිඟුපිටි ප්‍රධාන අමුද්‍රව්‍යක් වේ. විදේශීය අවන්හල් ලබන ලාභය මව් රට වෙතට රැගෙන යාම නිසා ඒවා රට තුළ ප්‍රාග්ධන සම්පාදනයට යෙදවීමට අවස්ථාවක් හිමි නොවේ. විදේශීය ධාන්‍ය ආනයනය හේතුවෙන් දේශීය කෘෂි බෝග සඳහා වෙළඳපළ අහිමි වන අතර එම බෝග වගා කිරීම සඳහා පවතින අභිප්‍රේරණයද හීන වෙමින් පවතියි. ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම මඟින් ගෙවුම්ශේෂ හිඟය තව දුරටත් පුළුල් වන බව පොදු පිළිගැනීමයි. මහබැංකු වාර්තාව (2015) දක්වන පරිදි ශ්‍රී ලංකාවේ ආහාර ආනයන වියදම ඩොලර් මිලියන 1627.8 ක් වන අතර ආහාර අපනයන ආදායම ඩොලර් මිලියන 112.6 කි. ගෙවුම්ශේෂ හිඟයට ආහාර ආනයන වියදම හා ආහාර අපනයන ආදායම අතර පරතරය සෘණාත්මක බලපෑම් කර ඇති බව මෙහිදී පැහැදිලිය. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ දේශීය පිසූ ආහාර අවන්හල්ද ව්‍යාප්ත වෙමින් පවතියි. එම අවන්හල් මඟින් දේශීය ආහාර පිසින ක්‍රමවේද, දේශීය ආහාර පිළිගන්වන ක්‍රමවේද භාවිත කරමින් දේශීය ආහාරවල ගුණය, රසය වෙතට නැවත වතාවක් සමාජීය අවධානය යොමු කර වීමට උත්සාහයක යෙදී සිටියි. ඉහළ ප්‍රචාරණ කටයුතු සිදු කරන, විශාල ශාඛා ප්‍රමාණයක් පවතින, වඩාත් සුදුසු අලෙවි උපක්‍රම භාවිත කරන විදේශීය පිසූ ආහාර සපයන අවන්හල් සමඟ දේශීය පිසූ ආහාර සපයන ආයතනවලට තරඟ කිරීමට ඇති හැකියාව අවම බව විද්වත් මතයයි. එම නිසා එම බාධක අභිබවා යමින් දේශීය ආහාර වෙළඳපල සකස් වීම අවශ්‍ය වේ. මෙවන් තත්ත්වයක් තුළ දේශීය ආහාර වෙළෙඳපොළක අවශ්‍යතාවය ඉස්මතු වෙමින් පවතියි. දේශීය ආහාර වෙළෙඳපොළක ඉදිරි ගමන සඳහා අවැසි වන අවස්ථාවන් හා එයට එරෙහි වන බාධාවන් අධ්‍යයනය කර ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීම තුළින් දේශීය ආහාර වෙළෙඳපොළත්, දේශීය කෘෂිකර්මාන්තයත්, දේශීය ආර්ථිකයත් ශක්තිමත් කළ හැකිය.

**සාහිත්‍යය විමර්ශනය**

වෙනස් වන පරිභෝජන රටාවන්, විවිධ ආහාර වර්ග සඳහා පවතින ඉල්ලුම, ආහාර ඉල්ලුම සඳහා බලපාන සාධක, ආහාර අලෙවිසැල් භාවිත කරන අලෙවිකරණ උපක්‍රම යන කරුණු පිළිබඳව දේශීයව මෙන්ම විදේශීයවද අධ්‍යයන රාශියක් සිදු කර ඇත. එහිදී ඇන්ඩ්‍රසන් හා සියාඕහොන් (Androson and xiaohon, 2009) විසින් චීන මහජන සමූහ ආණ්ඩුව හා ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල සංස්කෘතිය හා ක්ෂණික ආහාර වෙළෙඳපොළ මිශ්‍රණය පිළිබඳව බහුගුණ ප්‍රතිපායන ආදර්ශ යොදා ගනිමින් අධ්‍යයනයක් සිදු කර ඇත. ඇමෙරිකාවේ හා චීනයේ විශාල ප්‍රතිචාර දක්වන්නන් පිරිසක් තම කාලය හා අරමුදල් ඉතිරි කර ගැනීමට ක්ෂණික ආහාර පරිභෝජනය සිදු කරන බවට නිගමනය කර තිබේ. අවන්හල්වලට ළඟා වීමට ඇති පහසුව කෙරෙහි ඇමෙරිකා ජාතිකයින් සලකා බලන අතර චීන ජාතිකයින් පෝෂණය පිළිබඳව සිතා බලයි. අනෙක් කරුණ නම් චීනයේ වයස අවුරුදු තිස්පහට අඩු විශාල සේවා නියුක්ත පිරිසක් ක්ෂණික ආහාර ලබා ගැනීමට යොමුවීමය. පරිභෝජනය කරන ආහාර වර්ගය, ආහාර අලෙවිසැලේ නාමය, අලෙවිසැළ වෙත ළඟා වීමට බලපාන සාධක, මිල, පෝෂණය, රසය, සංස්කෘතික පරිසරය, වයස, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, රැකියා තත්ත්වය, පවුලේ සාමාජිකයින් ගණන යන කරුණු ඔස්සේ දත්ත රැස් කර ඇත. මීට සමානම අධ්‍යයනයක් ඉස්ලාම් හා උල්ලාහ් (Islam and

Ullah, 2010) විසින් සිදු කර තිබේ. බංගලාදේශයේ ක්ෂණික ආහාර වර්ග මත පරිභෝගික රුචියේ බලපෑම යන අධ්‍යයන මාතෘකාව යටතේ විශ්වවිද්‍යාල සිසුන් 250කින් යුක්ත නියදියක් ගෙන ව්‍යුහාත්මක ප්‍රශ්නාවලියක් භාවිතයෙන් දත්ත රැස් කර ඇති අතර SPSS ක්‍රමවේදය මඟින් දත්ත විශ්ලේෂණය කර ඇත. එහිදී සන්නම්නාමයේ කීර්තිය, රසයේ සමානාත්මතාවය, ආහාරවල ගුණත්වය හා පිරිවැය, ලබා දෙන වට්ටම් හා රසය, පරිසිදු බව, සැරසිලි හා අලෙවි හැකියාව යන සාධක කෙරෙහි පරිභෝගිකයින් වැඩි රුචිකත්වයක් දක්වන බව අවසන් නිගමනය වේ. ඇන්ඩ්‍රසන් හා සියාඕහොන් (Androson and xiaohon, 2009) විසින් සිදු කරන ලද අධ්‍යයනයේදී අවන්හලට ළඟා වීමට ඇති පහසුව, කාලය හා මුදල් ඉතිරි කර ගැනීමට ඇති අවශ්‍යතාවය මත ක්ෂණික ආහාර ලබා ගන්නා බව නිගමනය කර ඇති අතර ඉස්ලාම් හා උල්ලාහ් (Islam and Ullah, 2010) විසින් සිදු කළ අධ්‍යයනයේදී ඊට ප්‍රධානම හේතුව වී ඇත්තේ සන්නම්නාමයේ කීර්තියයි. චීන හා ඇමෙරිකා ජාතිකයින් අතර සන්නම්නාමය යන සාධකය ආහාර අළෙවිසැල් වෙත ළඟා වීම සඳහා විශාල බලපෑමක් සිදු නොකරයි.

**පර්යේෂණ ගැටලුව**

ශ්‍රී ලංකාවේ පරිභෝගිකයින් විදේශීය හා දේශීය ආහාර පරිභෝජනය වෙත යොමු වීමට බලපාන සාධක මොනවාද? යන්න කුරුණෑගල නගරය ආශ්‍රයෙන් සලකා බැලීම පර්යේෂණ ගැටලුව වේ.

**පර්යේෂණ අරමුණු**

ප්‍රධාන අරමුණ

- විදේශීය හා දේශීය ආහාර ඉල්ලුමට බලපාන සාධක සන්සන්දනය කිරීම. විදේශීය හා දේශීය ආහාර ඉල්ලුමට බලපාන ආදායම, වැටුප, රැකියාවේ ස්භාවය ආදී විචල්‍යයන්ගේ බලපෑම මෙන්ම රසය, පෝෂ්‍යදායී බව හා මිල ගණන් යන සාධක සම්බන්ධව සංසන්දනයක් සිදු කිරීමට මෙහිදී බලාපොරොත්තු වේ.

උප අරමුණු

- පුද්ගලයින්ගේ වයස් ව්‍යුහය ආහාර ඉල්ලුමට කරන බලපෑම අධ්‍යයනය කිරීම. පාරිභෝගිකයන්ගේ වයස් කාණ්ඩ හා දේශීය, විදේශීය ආහාරවලට ඇති රුචිකත්වය අතර සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම මේ මඟින් අදහස් කෙරේ.

- පුද්ගලයින්ගේ ආදායම් මට්ටම් විදේශීය හා දේශීය ආහාර ඉල්ලුමට කරන බලපෑම හඳුනා ගැනීම.

- කුටුම්භ ව්‍යුහයේ ස්වාභාවය හා ආහාර වියදම අතර සම්බන්ධය හඳුනා ගැනීම.කුටුම්භ ව්‍යුයේ ස්වාභාවය ලෙස මෙහිදී ඔහුගේ හෝ ඇයගේ රැකියාව, සේවයේ යෙදෙන පැය ගණන හා නිවසේ

ගෘහණියගේ වෘත්තීය තත්ත්වය යන සාධක යොදා ගනී. එම සාධක සමඟ දේශීය හා විදේශීය ආහාර ඉල්ලුම අතර පවතින සම්බන්ධතාවය මෙහිදී හඳුනා ගැනේ.

## පර්යේෂණ ක්‍රමවේදය

නියදිය තෝරා ගැනීම - කුරුණෑගල නගරය පදනම් කර ගනිමින් එහි පවතින දේශීය හා විදේශීය අවන්හල් වෙතට පැමිණෙන සසම්භාවී ලෙස තෝරා ගත් පාරිභෝගිකයින් 60 බැගින් පුද්ගලයින් 120 ක් නියදිය ලෙස තෝරා ගැනීම සිදු වේ. දේශීය ආහාර සපයන අවන්හල් ලෙස හෙළ බොජුන් අවන්හල්ද, විදේශීය ආහාර සපයන අවන්හල් ලෙස Dominos Pizza, Dine Hut, Pizza Hut, MyBurger අවන්හල්ද මෙහිදී යොදා ගනී. එම අවන්හල් තිරිඟු පිටි පදනම් කර ගත් අළෙවිසැල් වීම අත්‍යවශ්‍ය සාධකයක් වේ.

දත්ත රැස් කිරීම - තෝරාගත් නියදිය සඳහා ප්‍රශ්නාවලියක් යොමු කිරීම මඟින් පාරිභෝගිකයින් මෙම අවන්හල් වෙත පැමිණීමට හේතු සාධක හා එසේ පැමිණන පාරිභෝගිකයින්ගේ ජීවන රටාවන් සම්බන්ධව දත්ත රැස් කිරීම සිදු වේ. ඊට අමතරව ද්විතික දත්ත මූලාශ්‍ර ලෙස සංඛ්‍යාන නිබන්ධන, මහබැංකු වාර්තා, එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්තා ආදී දත්ත මූලාශ්‍ර භාවිත කර ඇත.

ප්‍රතිපායන ආදර්ශ විශ්ලේෂණය

$$Y_i = \alpha_0 + \alpha_1 I_i + \alpha_2 F_i + \beta_1 D_{pi} + \beta_2 D_{ti} + \mu_1 D_{oi} + \lambda_1 D_{mi} + U_i$$

$Y_i$ = දේශීය/විදේශීය ආහාර සපයන අවන්හලකින් එක් පුද්ගලයකුට ආහාර ගැනීම සඳහා සතියකට වැය වන වියදම

$I_i$ = පාරිභෝගිකයාගේ මාසික ආදායම

$F_i$ = නිවසේ/රැකියා ස්ථානයේ සිට අවන්හලට ඇති දුර

$D_{pi}$ = පාරිභෝගිකයාගේ වයස අවුරුදු 20-30 අතර නම් = 1

$D_{ti}$ = පාරිභෝගිකයාගේ වයස අවුරුදු 40ට වැඩි නම් = 1 (මෙහිදී අත්හරින ලද කාණ්ඩය අවුරුදු 31-40 අතර වයස් කාණ්ඩය වේ.

$D_{oi}$ = විධිමත් රැකියාවක නිරත වන (පැය 8ක සේවා කාලයේ නිරත වන්නේ නම්=1, විධිමත් රැකියාවක නිරත නොවන්නේ නම් 0)

$D_{mi}$ = මව/ගෘහණිය රැකියාවක නිරත වන්නේ නම් = 1, රැකියාවක නිරත නොවන්නේ නම් = 0

$U_i$ = දෝෂ පදය

මෙම ප්‍රතිපායන ආදර්ශය විශ්ලේෂණය මඟින් ඒ ඒ අවන්හල් වෙත පැමිණෙන පාරිභෝගිකයින් සිදු කරන වියදම වයස, ආදායම, සේවාවේ නිරත වන පැය ගණන, අවන්හලට ඇති දුර යන සාධක සමඟ ඇති සම්බන්ධතාවය මිනුම් කරනු ලබයි.

**විස්තරාත්මක දත්ත විශ්ලේෂණය**

SPSS හා Excel මෘදුකාංගභාවිත කරමින් වගු හා ප්‍රස්තාර මඟින් පාරිභෝගිකයින් මෙම අවන්හල් වෙත පිවිසීමට බලපාන සාධක විශ්ලේෂණය කිරීමක් තව දුරටත් සිදු වේ. එහිදී පෝෂණය, රසය, සන්නම් නාමය, ප්‍රචාරණය, ආහාර මිල ගණන් යන සාධක කෙරෙහි අවධානය යොමු කරයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

Islam, N. and Ullah, G.M.S. 2010. Factors Affecting Consumers' Preferences on Fast Food Items in Bangladesh. *The Journal of Applied Research*. 26(4): 131-146.

Saraniya, D. and Dinesh, T. 2015). Personal Factors And Fast Food Consumption In Colombo Divisional Secretariat Division'. *International Journal of Research and Development Organization*. 1(12): 66-75.

Senauer, B., Shan, D. and Alderman, H. 1986. The Effect of the Value of Time on Food Consumption Patterns in Developing Countries: Evidence from Sir Lanka. *American Journal of Agricultural Economics*. 68(4): 920- 927.

Zia, S. and Yasmeen, S. 2014. Service Effectiveness of Local and Multinational Restaurants in Pakistan*'*. *International Journal of Arts and Commerce*. 3(4): 113-132.